# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2199/2 - 2020 ඔක්තෝබර් මස 26 වැනි සඳුදා - 2020.10.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උපවගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් 2019 දෙසැම්බර් මස 05 දිනැති 2152/32 දරන ගැසට් නිවේදනයේ 2 වන ඡේදයේ (බ) උපඡේදයට වහාම පහතින් පහත උපඡේදය එකතු කිරීමෙන් සංශෝධනය කරමි.

"(ග) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව ආනයනය කරන සහ ආනයනය කොට සපයනු ලබන සෞඛ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය පරීක්ෂණ කට්ටල ඇතුළු වෛද්‍ය උපකරණ සහ උපාංග"

මෙම නියෝගය 2020 ඔක්තෝබර් මස 27 වැනි දින සිට බලපැවැත්වේ.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

12 - 29

1A - PG 5221 — 570 (2020/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*